# දේශීය පාලන සමයේ ඉඩම් අයිතිය හා භුක්තිය සම්බන්ධයෙන් රජුගේ කාර්යභාරය

**ජේ .කේ. ඒ .කාන්ති**

ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයන අංශය,
රුහුණ විශ්වවිද්‍යාලය.
jkajayasinghe@yahoo.com

**සංක්ෂේපය**

*දේශීය පාලන ක්‍රමය යටතේ ඉඩම් රජයේ ප්‍රධාන ආදායම් මාර්ගය වූ අතර ආර්ථිකය ප්‍රධාන වශයෙන්ම ඉඩම පදනම් කොට ගත් කෘෂිකර්මාන්තය මත රඳා පැවතිණ. රටේ සමස්ත භූමියෙන් නිශ්චිත ව වෙන් කර ගත් කොටස 'ඉඩම' නමින් හැඳින්වී ය. මෙම ඉඩමට ඇති අයිතිය ඉඩම් භුක්තිය ලෙස හඳුන්වයි. ඉඩම් භුක්තිය පිළිබඳව ඓතිහාසික දෘෂ්ටියකින් කරුණු අධ්‍යයනය කිරීමේ දී ශ්‍රී ලංකාවේ පැරණි ඉඩම් භුක්තියට හිමි වන්නේ වැදගත් ස්ථානයකි. මෙම ඉඩම් භුක්ති ක්‍රමය යටතේ රජු රටේ සියලු ඉඩම්වල ස්වාමියා ලෙස පිළිගත් සම්ප්‍රදායක් ගොඩනැගී තිබිණි. ගොවිතැන් කටයුතු සඳහා අවශ්‍ය ඉඩම් මෙන් ම ජල සම්පාදන සපහසුකම් ද රජය මගින් ජනතාවට නොමිලයේ ලබා දෙන ලදී. මෙම කටයුතු සඳහා වෙන ම නිලධාරීන් පිරිසක් පත්කොට තිබිණි. එසේ වුව ද රජු මෙම කටයුතු පිළිබඳව පුද්ගලිකව සොයා බැලීමක් ද සිදු කෙරිණි. භූමියේ අධිපතියා වශයෙන් රටවැසියන් ආරක්ෂා කිරීම මෙන් ම ඔවුනට ජීවනෝපාය සලසා දීම ද තමන්ගේ යුතුකම හා වගකීම බව රජතුමා පිළිගත්තේ ය. පුන්‍ය ආයතන හා පොදු ආයතනවලට ඉඩම් ලබා දීම රජුගේ ප්‍රධාන කාර්යභාරයක් විය. එයට අමතරව විශේෂ නිල තනතුරු දැරූවන්ට ද, විශේෂ කුසලතා දැක්වූවන්ට ද, රජයට පක්ෂපාතීත්වයෙන් කටයුතු කළ අයට ද කරන ලද ඉඩම් පරිත්‍යාග පිළිබඳ තොරතුරු මූලාශ්‍රයවල සඳහන් වේ. ජනතාවට ලබා දුන් ඉඩම් වෙනුවෙන් රජු යම් බද්දක් අය කළ අතර එම සේවය වෙනුවෙන් රජයට බදු ගෙවීම තම යුතුකමක් ලෙස ජනතාව ද සිතූහ. රටවැසියා තලා පෙළා බදු අය කිරීමට පාලකයා කටයුතු නො කළේ ය. දේශීය පාලකයා හා ජනතාව අතර පැවති අන්‍යොන්‍ය බැඳීම මෙන් ම පාලකයාගේ දැඩි කැපවීම දේශීය ඉඩම් ප්‍රතිපත්තිය සාර්ථකව පවත්වා ගෙන යාමට ඉවහල් වී ඇත.*

**ප්‍රමුඛ පදඃ** *රජු, ඉඩම් අයිතිය, භුක්තිය, භූපති, කෘෂිකර්මාන්තය*

## 1. හැඳින්වීම

යුරෝපා ජාතීන් ලංකාවේ පාලන බලය අත්පත් කර ගැනීමට පෙර පැවති පාලන ක්‍රමය දේශීය පාලන ක්‍රමය වශයෙන් හැඳින්වේ. මෙකල රාජාණ්ඩු පාලන ක්‍රමයක් පැවති අතර රජ එහි ප්‍රධානියා විය. දේශීය රාජධානි සමයේ ඉඩම් අයිතිය හා භුක්ති ක්‍රමය යටතේ රටේ සියලු ඉඩම් සම්බන්ධයෙන් රාජ්‍ය පාලකයා සතුව විශේෂ බලයක් පැවතිණි. රටේ සියලු ඉඩම්වල ස්වාමියා වූ රජු එම ඉඩම් ගොවිතැන් කටයුතු සඳහා ජනතාවට බෙදා දුන්නේය. එමෙන් ම කෘෂිකර්මාන්තය නගා සිටුවීම සඳහා වැව් අමුණු ඉදි කරවා ජල සම්පාදනයට ද මුල් විය. වසභ, (ක්‍රි. ව. 65- 109 ) රජු, මහසෙන් (ක්‍රි. ව. 276-303) රජු, ධාතුසේන (ක්‍රි.ව.459-477) රජු, 1වන පරාක්‍රමබාහු (ක්‍රි. ව. 1153-1186) රජු ආදී බොහෝ පාලකයෝ එසේ වැව් ඉදි කරවා රටේ ආර්ථිකය නගා සිටුවීමට අනුග්‍රහ දැක්වූහ. දේශීය පාලන සමයේ බලයට පත් වූ සෑම පාලකයෙකු ම ගොවිතැන් කටයුතු සංවර්ධනය කළ අයුරු සෙල්ලිපිවලින් මෙන් ම මහාවංසයේ එන ඇතැම් තොරතුරුවලින් ද පැහැදිලි වේ.

රටේ ඉඩම්වල ස්වාමිත්වය රජුට හිමි වීම නිසා ම ඔහු භූපති යනුවෙන් හැඳින්වීමට මෙරට ජනතාව පුරුදු වී සිටිය හ. භූමියේ අධිපතියා මෙන් ම පෘථිවියේ ආරක්ෂකයා යන අදහස ද මෙහි ගැබ් වී ඇත. ශ්‍රී ලංකාවේ රාජ්‍යත්වය ඉතා ගෞරවනීය තත්ත්වයකින් පැවති අතර

රජු රටේ සියලු ම ජනතාවගේ නායකයා ලෙස පිළිගැනිණි. පාලන තන්ත්‍රයේ නායකයා වූයේ ද රජතුමා ය. රටේ ප්‍රමුඛයා වූ බැවින් රජු මපුර්මුකා හෙවත් මහාප්‍රමුඛ යන නම්වලින් ද හඳුන්වා ඇත. අනුරාධපුර හා පොළොන්නරු රාජධානි සමයන්හි පමණක් නොව ඉන් පසුව ද හෙළ සිරිත අනුව කිසියම් පාලකයකු රටේ නීත්‍යානුකූල රජු වශයෙන් පිළිගැනුනේ ඔහු රාජාභිෂේකය ලැබ සේසත් නැංවීමෙන් අනතුරුව ය. එසේ අභිෂේක ලබා රාජ්‍යය භාර ගැනීමෙන් අනතුරුව එහි පාලනය පවත්වා ගෙන යාමේ දී රාජ්‍ය පාලනය හා සම්බන්ධ පුරාණ චාරිත්‍ර ධර්ම හා ලෝක චාරිත්‍ර හෙවත් පෙර සිරිත අකුරට ම පිළිපැදීම ඔහුගේ වගකීම විය. පෘතුගීසි හා ලන්දේසීන් යම් පමණකට ද, බ්‍රිතාන්‍ය පාලකයන් පුළුල් වෙනසකට ද භාජනය කරන ලද දේශීය ඉඩම් අයිතිය හා භුක්තිය පිළිබඳ ව මෙමගින් ගැඹුරින් අධ්‍යයනය කෙරේ.

## 2. සාහිත්‍යය විමර්ශනය

දේශීය ඉඩම් අයිතිය හා භුක්තිය සම්බන්ධයෙන් සිදු කරන ලද පූර්ව පර්යේෂණ ඇත්තේ ඉතා අඩු ප්‍රමාණයකි. ඒ අතර කොඩ්රින්ටන් (1980) විසින් රචිත Ancient Land Tenure and Revenue in Ceylon නැමති කෘතිය වැදගත් වේ. 1938දී පමණ මෙම කෘතිය රචනා කර ඇත. ශ්‍රී ලංකාවේ සිවිල් සේවයේ නිරත වුවකු ලෙස ඔහු විසින් ලබා ගත් අත්දැකීම් හා තොරතුරු මූලික කර ගෙන රචනා කොට ඇති මෙම කෘතිය දේශීය ඉඩම් භුක්ති ක්‍රමය පිළිබඳ කරුණු සෙවීමේ දී යම් පමණකට ඉවහල් කර ගත හැකි ය. සාම්ප්‍රදායික ගම යන්න ක්‍රමානුකූලව විග්‍රහ කොට ගමේ ඉඩම් වර්ග කිරීම, සේවා භුක්ති ක්‍රම හා වෙනත් භුක්ති ක්‍රම, අය බදු ගෙවීම් ආදී තොරතුරු රාශියක් අනාවරණය කරමින් මෙහි කරුණු දක්වා ඇත. එසේ වුව ද දේශීය ඉඩම් අයිතිය හා භුක්තිය පිළිබඳව ඒ සම්බන්ධයෙන් රජුගේ කාර්යභාරය පිළිබඳ ප්‍රමාණවත් සාකච්ඡාවක් මෙමගින් සිදු කොට නැත. අභයවර්ධන විසින් 1978දී රචනා කරන ලද කඩඉම් පොත් විමර්ශනය නැමති කෘතිය පැරණි ශ්‍රී ලංකාවේ ඉඩම් භුක්තිය පිළිබඳව තොරතුරු අධ්‍යයනය කිරීමේ දී වැදගත් වේ. දේශීය ඉඩම් භුක්ති ක්‍රමය යටතේ සේවය මත පදනම් වී ලැබුණු විවිධ ඉඩම් පිළිබඳව මෙහි සවිස්තරව කරුණු දක්වා ඇත. ආකර ගම්, පටුනු ගම්, අරමුදලෙ ගම්, ගබඩාගම්, බිසෝගම්, ලැමනිගම් ආදී වශයෙන් ඉදිරිපත් කොට ඇති තොරතුරු ඉතා වැදගත් වේ. මීට අමතරව ලංකාවේ ඉඩම් පිළිබඳව තව දුරටත් විග්‍රහ කරමින් මුල්කැට, මුල්වර ලිවීම, ගම්වර, ප්‍රවේණි සැලැස්ම හා කෘෂිකර්මාන්තය පිළිබඳව ද කදිම විග්‍රහයක් ඉදිරිපත් කොට ඇත. දේශීය පාලන සමයේ ඉඩම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී රජු විශාල කාර්යභාරයක් ඉටු කරනු ලැබුව ද ඒ කෙරෙහි කතුවරයා අවධානය යොමු කොට නැති බව බව පැහැදිලි ය. ශ්‍රී ලංකාවේ ඉඩම් අයිතිය හා භුක්තිය සම්බන්ධයෙන් කරනු ලබන අධ්‍යයන බොහොමයක් බ්‍රිතාන්‍ය පාලන සමයේ ඇති වූ වතු වගාව සමග සම්බන්ධ කොට සාකච්ඡා කර ඇතත් දේශීය ඉඩම් අයිතිය හා භුක්තිය පිළිබඳ වැඩි දෙනෙකුගේ අවධානයට හා සාකච්ඡාවට භාජනය වී නොමැත.

## 3. පර්යේෂණයේ අරමුණ

දේශීය පාලන සමයේ ඉඩම් අයිතිය හා භුක්තියේ ස්වරූපය හා ඒ සම්බන්ධයෙන් රජුගේ කාර්යභාරය හඳුනා ගැනීම.

## 4. පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණය මූලික වශයෙන් ම පුස්තකාල පරිශීලනය ඔස්සේ සිදු කෙරිණි. ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍ර පදනම් කර ගනිමින් සිදු කරන ලද මෙම අධ්‍යයනයේ දී රාජ්‍ය ලේඛනාගාරය, කොළඹ ජාතික පුස්තකාලය, කොළඹ මහජන පුස්තකාලය, පේරාදෙණිය හා රුහුණ විශ්වවිද්‍යාලයීය පුස්තකාල බෙහෙවින් ප්‍රයෝජනවත් විය.

## 5. විශ්ලේෂණය

### 5.1 රජු සතු ඉඩම් අයිතිය හා ඉඩම් බෙදාදීම

දේශීය පාලන සමයේ පැවති පිළිගැනීම අනුව පාලකයකු වශයෙන් රජුගෙන් ඉටු විය යුතු සේවාව වූයේ ලෝකය හා ශාසනය සංවර්ධනය කිරීම යි. මෙහි ලෝකය වශයෙන් හඳුන්වා ඇත්තේ තම රටවැසියා ය. ශාසනය යනුවෙන් හැඳින්වූයේ බුදු සසුන යි. තම රටවැසියා වැසියා අභ්‍යන්තර හා බාහිර සතුරන්ගෙන් ආරක්ෂා කර ගැනීම, දුර්භික්ෂ හා වසංගත රෝග වැනි ආපදාවලින් ඔවුන් මුදවා ගැනීම ආදිය ලෝකය සංවර්ධනය කිරීම සඳහා ඔහුගෙන් ඉටු විය යුතු යුතුකම විය. රටේ සියලු ජනතාවගේ නායකයා වූ බැවින් එම ජනතාවගේ ජීවනෝපාය සලසා දීම මෙන් ම ඔවුන්ට ආරක්ෂාව සලසා දීම ද රජු වෙත පැවරුණ යුතුකම මෙන් ම වගකීම ලෙස පිළිගැනී තිබිණි. එපමණක් නොව රටේ සියලු සම්පත්වල අධිපතියා වූයේ ද රජු ය. විශේෂයෙන් භූමියේ අධිපතියා ලෙස භූපති, පෘථිවිසාමි යන නාමයන්ගෙන් රජු හඳුන්වනු ලැබිණ. තම රාජ්‍යය සතු ගම් බිම් වැව් අමුණු ආදිය තමාගේ අභිමතය පරිදි වෙහෙර විහාර, රෝහල් ආදියට හෝ ඕනෑ ම පුද්ගලයෙකුට හෝ පවරා දීමේ බලයක් රජු සතු ව පැවතිණ (රණවැල්ල, 2003: 219,220). මෙවැනි බලයක් රජු සතුව පැවති බව ද එම බලය ඔහු විසින් පාවිච්චි කළ බව ද සෙල්ලිපි හා වංසකතා තොරතුරු මගින් හෙළි වේ. කුටකන්න අභය (ක්‍රි. පූ. 41-19) රුහුණේ උපරජු වශයෙන් කටයුතු කළ සමයේ රජගල ප්‍රදේශයේ වැඩ විසූ භික්ෂූණ් වහන්සේලාට සිවුරු සපයා ගැනීමට අවශ්‍ය වියදම් ලබා ගැනීම සඳහා සවති හා අටුසබ නම් ගම් දෙක පවරා දී ඇත (Paranavitana, 1983: 4). වසභ රජු (ක්‍රි. ව. 65-109) මාගම අනුරාරාම නම් විහාරයක් කරවා හේළිගම නම් වූ ගමකින් කිරිය අට දහසක ඉඩම් එයට පවරා දෙනු ලැබී ය (රණවැල්ල, 2003: 228).

වෝහාරික තිස්ස (ක්‍රි. ව. 214-236) රජුගේ බෝවත්තේගල පර්වත ලිපියෙහි එකල රුහුණේ පාලකයාව සිටි නක හෙවත් නාග නම් අමාත්‍යයකු විසින් රජය සතු කුඹුරක් හා වැවක් එහි වූ විහාරයකට පූජා කරන ලද බව සඳහන් වේ (රණවැල්ල, 2003: 228). පළමුවන විජයබාහු (ක්‍රි. ව. 1055 -1119) රජතුමා විසින් සිරිපා වන්දනා කරන්නන්ට දන් වැටුප් පිණිස හැල් කෙත් ආදියෙන් සමෘද්ධිමත් වූ ගිලීමලය ගම පූජා කළ බව මහාවංසයේ සඳහන් වේ (ශ්‍රී සුමංගල සහ ද සිල්වා, 1912: 60 පරි, 64-66 ගාථා).

ශ්‍රී ලංකාවට බුදුදහම හඳුන්වාදීමත් සමග මෙරට සිටි සෑම පාලකයෙක් ම වාගේ බුදු සසුන ආරක්ෂා කිරිමට හා සංවර්ධනය කිරීමට ඇප කැප වී ක්‍රියා කළහ. එමෙන් ම බුදු සසුනේ ආරක්ෂකයා ලෙස තමා සතු වටිනාම සම්පත් පවා සසුන වෙනුවෙන් පූජා කිරීමට පාලකයෝ පෙලඹුණහ. භූමියේ අධිපතියා වශයෙන් ඔහු සතු වූ වටිනා ම සම්පතක් ලෙස භූමිය හැඳින්විය හැකි ය. මන්ද යත් රජුගේ බලය රැකී තිබීමට අත්‍යවශ්‍ය වූ ආර්ථික ශක්තිය රඳා පැවතියේ භූමිය මත වූ බැවිනි. තමා සතු මෙම වටිනා ම සම්පත සසුන වෙනුවෙන්

කැප කිරීමට ඇතැම් පාලකයින් පෙලඹුණු බවට ශ්‍රී ලංකා ඉතිහාසයෙන් තොරතුරු අනාවරණය වේ. ශ්‍රී මහා බෝධිය ශ්‍රී ලංකාවට වැඩම කළ අවස්ථාවේ දේවානම්පියතිස්ස (ක්‍රි. පූ. 250-210) රජු ලංකා රාජ්‍යය ශ්‍රී මහා බෝධියට පූජා කළේ ය. එසේ කිරීමට රජුට හැකියාවක් පැවතියේ ශ්‍රී ලංකා භූමියේ හිමිකරු තමා යයි විශ්වාසයක් පැවති බැවිනි (ශ්‍රී සුමංගල සහ ද සිල්වා, 1912: 19 පරි, 27-31 ගාථා). දුටුගැමුණු (ක්‍රි. පූ. 161-137) රජු රුවන්වැලි සෑයෙහි නිදන් කිරීම සඳහා වැඩම කරවූ ධාතූන් වහන්සේලා තුන් වරක් ම ශ්‍රී ලංකා රාජ්‍යයෙන් පුදනු ලැබුවේ ද භූමිය සඳහා රජුට ඇති මෙම අයිතිය පදනම් කර ගනිමිනි (ශ්‍රී සුමංගල සහ ද සිල්වා, 1912: 31පරි, 91-93 ගාථා).

## 5.2 ආගමික කටයුතු සඳහා ඉඩම් ප්‍රදානය කිරීම

සමස්ත භූමියේ අයිතිය රජය සතු වුව ද එම ඉඩම් සියල්ල පුද්ගලිකව රජු සතු වූ බව මින් අදහස් නො වේ. වැඩ කිරීම සඳහා පිරිස ලබා ගත හැකි කවරෙකුට වුව ද වැව් තැනීමට හෝ ඉඩම් වගා කරවීමට රජයෙන් කිසිදු බාධාවක් නො වී ය. වැඩි වැඩියෙන් ඉඩම් වගා කළ තරමට රජතුමාගේ ආදායම ද වැඩිවන හෙයින් එක් එක් පුද්ගලයන් ඉඩම් සංවර්ධනය පිළිබඳව උනන්දුවක් දැක්වීම රජතුමාට ද ප්‍රයෝජනවත් විය. පුද්ගලික ඉඩම් අයිතිය තිබූ පිරිසක් මෙකල සිටි බවට සෙල්ලිපි මෙන් ම වංස කතා ද සාක්ෂ්‍ය සපයයි. දේශීය ඉඩම් භුක්ති ක්‍රමය යටතේ රටේ සියලු ඉඩම් රජු සතු නො වූ බව පෙරේරා නිදසුන් සහිතව දක්වා ඇත (Perera, 1959: 03). ප්‍රවේණියෙන් උරුම වූ ඉඩම් පූජා කිරීමට හෝ විකිණීමට අයිතිකරුවන්ට බලය තිබුණි. ඇතැම් රජවරුන් වැව් සහ ඉඩම් මිල දී ගත් බව සෙල්ලිපිවල සඳහන් වී තිබීමෙන් මේ බව තහවුරු වේ.

මිහිඳු හිමියන් ශ්‍රී ලංකාවට බුද්ධාගම හඳුන්වා දුන් පසු ශ්‍රී ලංකාවේ බොහෝ රජවරුන් තම ශ්‍රමය කැප කොට ලබා ගත් මුදලින් ආගමික පුද පූජාවන් සිදු කිරීමට පෙලඹීම සුවිශේෂී ලක්ෂණයකි. තමන් මහන්සි වී උපයා ගන්නා දෙයක් බුදුන් වහන්සේට පූජා කිරීම මාහැඟි පින්කමක් ලෙස සිතා මෙබඳු කටයුතුවල නිරත වීමට රජවරු පෙලඹුණහ. මේ ආකාරයට එක් අවස්ථාවක දී සද්ධාතිස්ස (ක්‍රි. පූ. 137-119) රජු ගොවියකු ලෙස වෙස් වලාගෙන හැල් කෙතක වැඩ කොට කෙත හිමි පුද්ගලයාගෙන් ලබා ගත් සහල්වලින් මහා සංඝයා වහන්සේලාට දානයක් පිළිගැන්වූ බව සීහලවත්ථුප්පකරණයේ සඳහන් වේ (බුද්ධදත්ත සහ ධම්මකිත්ති, 1959: 26). මෙවැනි ම තවත් සාධක මහාවංසයෙන් ද උකහා ගත හැකි ය. මහාචූලික මහා තිස්ස (ක්‍රි. පූ. 76-62) රජතුමා, සිය කය වෙහෙසා උපයා ගත් ධනයෙන් දෙන ලද දානය අනුසස් වැඩි බව අසා රාජ්‍යත්වයට පත් මුල් වසරේ ම පසල් දනව්වලට ගොස් අප්‍රසිද්ධ වේශයෙන් හැල් කෙතක වැඩ කර ලබා ගත් කුලියෙන් මහාසුම්ම තෙරුන් වහන්සේට දානයක් පූජා කළේ ය (ශ්‍රී සුමංගල සහ ද සිල්වා, 1912: 34 පරි, 1-4 ගාථා). මහවැලි ගඟින් උතුරු ප්‍රදේශයේ කෙළෙඹි පුත්‍රයකුට විශාල හැල් කෙත් යායක් අයිතිව තිබූ බව රසවාහිනියේ සඳහන් වේ (සරණතිස්ස, 1939: 166). සබ (ක්‍රි.ව. 59-65) රජු කහවනු පන්සියයක් ගෙවා උප්පල දෝණික නම් වූ වැවක් මිලට ගත් බවත් තවත් කහවනු පන්සියයක් දී එය පිළිසකර කරවා වෙහෙර වැඩ විසූ භික්ෂූන් වහන්සේලාට පූජා කළ බවත් විහාරෙගල සෙල්ලිපියේ දැක්වේ (Paranavitana,1983: 61). රජතුමා මෙසේ වැව මිල දී ගැනීමෙන් පැහැදිලි වන්නේ එම දේපළ රජු සතුව නොපැවති බව යි. එමෙන් ම ගජබාහුක ගාමිණී (ක්‍රි. ව. 112-134) රජුගේ මව කහවනු 400ක් ගෙවා කුඹනගල වැව මිල දී ගත් බව විළේවැව අභිලේඛනයේ දක්වා ඇත (Paranavitana, 1983: 98). තිඹිරිවැව ලිපියේ සඳහන්

ආකාරයට ගොවිය නකළ ඇමති විසින් තමාට අයත් වැව්වලින් ලැබූ ත්‍රිවිධ ආදායම් (දකපති, බොජකපති හා මතරමජිබකපති) භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් පූජා කොට ඇත (Paranavitana, 1983: 109). එමෙන් ම පෙරියම්කුලම් ලිපියේ සඳහන් නාග නැමැත්තෙකු සුදර්ශන භාවනා මධ්‍යස්ථානයට කෙතලක වැවේ සියලු බදු ද, ඔහුගේ පියා සතු වූ බදුවලින් කොටසක් ද ලබා දුන්නේ ය (Paranavitana, 1983: 66). මෙසේ ක්‍රි. ව. 1වන සියවසේ සිට 12වන සියවස දක්වා ශ්‍රී ලංකාවේ සෙල්ලිපි විමර්ශනය කරන විට සාමාන්‍ය ජනයා සතුව පැවති ඉඩම් අයිතිය පිළිබඳ තොරතුරු රාශියක් අනාවරණය කර ගත හැකි ය. එමෙන් ම ඔවුන් තම ඉඩම් අන්‍යයන්ට විකුණූ අයුරු හා ප්‍රදානය කළ අයුරු පිළිබඳ තොරතුරු එම සෙල්ලිපිවල අන්තර්ගත වී ඇත (Paranavitana, 1983: 93). හිඟුරේගල විහාර සෙල්ලිපියේ සඳහන් ආකාරයට එක්තරා හේවා කණ්ඩායමකට අයත්ව තිබූ ඉඩමක් ඔවුන් විසින් විහාරස්ථානයකට විකුණනු ලැබිණි (Paranavitana and Godakumbura, 1963: 116). ක්‍රි. ව. 13වන සියවසේ කහම්බල්කුල මින්දල්නා නම් දෙමළ අධිකාරිවරයා ඇතුළු පිරිසක් විසින් ගලපාත විහාරයට ඉඩම් ප්‍රදානයක් කරන ලද බව ගලපාත විහාර ලිපියේ දක්වා ඇත (මේධානන්ද, 2013: 251-253).

### 5.3 ඉඩම්වලින් බදු අයකිරීම

භූමියේ අධිපතියා වශයෙන් රටවැසියන් ආරක්ෂා කිරීම තමන්ගේ යුතුකම ලෙස රජු සැලකුවා සේ ම එම සේවය වෙනුවෙන් රජුට බදු ගෙවීම තම යුතුකමක් ලෙස ජනතාව ද සිතූහ. එමෙන් ම ජනතාව ඒ සඳහා බැඳී සිටියහ. දේශීය පාලනය පැවති සමයේ මෙසේ බදු ගෙවීම අකමැත්තෙන් කළ බවට හෝ එය ජනතාවට පීඩාවක් වූ බවට හෝ තොරතුරු හමු නො වේ. එසේ නොවූයේ රටවැසියා තලා පෙළා බදු අය කිරීමට පාලකයන් කටයුතු නොකළ බැවිනි. ජනතාව විසින් ගෙවන ලද මෙම බද්ද සෙල්ලිපිවල මෙන් ම සාහිත්‍ය මූලාශ්‍රයවල ද විවිධ නම්වලින් හඳුන්වා ඇත. බලි, කර, භාග, පත්ති යන වදන්වලින් මහාවංශයේ මෙම බද්ද හඳුන්වා ඇති අතර (ශ්‍රී සුමංගල සහ ද සිල්වා, 1912: 35 පරි, පරි 54). බක, කර, බලි හා පති යන පද සෙල්ලිපිවල ද සඳහන් වී ඇත (රණවැල්ල, 2003: 243). පසුකාලීන සෙල්ලිපි හා සාහිත්‍ය මූලාශ්‍රයවල කරවුවර හෝ බදු කරවුවර යන පද ඒ සඳහා භාවිත වී ඇත (රණවැල්ල, 2003: 243).

අතීතයේ සිට ම ගොවිතැන මෙරට ජනතාවගේ ප්‍රධාන ආදායම් මාර්ගය වූ හෙයින් රජුගේ ප්‍රධාන ආදායම් මාර්ගය වූයේ ද ගොවීන්ගෙන් අය කර ගත් ධාන්‍ය බද්ද යි. මෙරට සෑම ගොවියෙක් ම තමන්ගේ අස්වැන්නෙන් කොටසක් බදු වශයෙන් රජුට ගෙවීමට බැඳී සිටි අතර 'රජුට බදු ගෙවීම' යන්නෙන් අදහස් වූයේ "රජය සඳහා බදු ගෙවීම" යන්න යි. මෙසේ රජයේ දේපළවලින් බදු ලබා ගැනීම රජුගේ ආධිපත්‍යය ඒ ඒ ප්‍රදේශවලට ගෙනයාමක් ද විය (ධීරානන්ද, 2004: 334). අනුරාධපුර යුගයේ මෙන් ම පොළොන්නරු යුගයේ ද ඉඩම් වගා කළ පුද්ගලයන්ට රජයේ ඉඩම් වෙනුවෙන් බදු ගෙවීමට සිදු වූ බව සඳහන් වන සෙල්ලිපි හමුවේ. ඉඩම්වලින් අය කළ බදු බොජකපති නම් විය. මීට අමතරව ජල බදු (දකපති) මත්ස්‍ය භාගයන් (මතෙරමජිබකපති) වරාය බදු (සුක) මෙන් ම අධිකරණ ශාලාවලින් ද රජුට බදු ආදායම් ලැබිණි. ඇතැම් අවස්ථාවල රජුට ඉහත කී අංශවලින් ලැබුණු අදායම ආගමික සිද්ධස්ථානවලට පූජා කරනු ලැබිණ. ගජබාහුක ගාමිණී රජු (ක්‍රි. ව. 112-136) ගොඩවාය වරායෙන් ලද ආදායම ගොඩවාය විහාරස්ථානයට පූජා කළ බව එහි පිහිටුවා ඇති සෙල්ලිපියක සඳහන් වේ (Paranavitana, 1983: 96). එමෙන් ම සිතුල්පව්වේ

පිහිටි ගජබාහුක ගාමිණී රජුගේ සෙල්ලිපියක අධිකරණ ශාලාවලින් ලබා ගත් බදු ආදායම සිතුල්පව්ව විහාරස්ථානයට පූජා කළ බව දැක්වේ (Paranavitana, 1983: 96). අනුරාධපුර යුගයේ මුල් කාල සීමාවේ ධාන්‍ය ආදී කෘෂිකාර්මික නිෂ්පාදනවලින් රජයට ලැබුණු බදු ආදායම මහපති බොජකපති හෙවත් බොජීයපති ආදී පදවලින් හඳුන්වා ඇත (රණවැල්ල, 2003: 243). ක්‍රි. ව. දෙවන සියවසට අයත් දුනුමඩලා කන්දේ ඇති ගිරිලිපියක මෙම බද්ද බොජක බක යනුවෙන් හඳුන්වා ඇත (රණවැල්ල, 2003: 243). අනුරාධපුරයේ අවසාන භාගයට අයත් සෙල්ලිපිවල මෙලාත්ති, මෙලාච්චි, මෙලාට්සි ආදී වශයෙන් හැඳින්වෙන බදු විශේෂයක් ගැන ද සඳහන් වන අතර මෙය ද ගොඩ මඩ ඉඩම්වල අස්වැන්නෙන් රජුගේ කොටස ගණන් බලා ගෙවන ලද්දක් ලෙස සැලකේ. නිශ්ශංකමල්ල (ක්‍රි. ව. 1187-1196) රජුගේ ගල්පොත සෙල්ලිපියේ ගොඩ මඩ ඉඩම්වලින් ලබාගත් ආදායම හඳුන්වා ඇත්තේ කෙත්වත් අය යනුවෙනි (රණවැල්ල, 2003: 243). පොලොන්නරුවේ පිහිටා ඇති නිශ්ශංකමල්ල රජුගේ ගල් ආසන සෙල්ලිපියේ කැතිඅඩ නම් වූ තවත් ඉඩම් බද්දක් පිළිබඳ ව සඳහන් වේ. මෙම බද්ද හේන් ගොවිතැන්වලින් අය කර ගෙන ඇත (රණවැල්ල, 2003: 126). මෙම බද්ද සෙහෙත් කටුසර අය යනුවෙන් ද ගල්පොත සෙල්ලිපියේ දක්වා ඇත (රණවැල්ල, 2003: 105). හේන් වගාවෙන් මෙන් ම ගෙවතු වගා වශයෙන් පවත්වා ගෙන යනු ලැබූ විවිධ වැවිලි වර්ග එනම්, පොල් ,පුවක් ආදිය වගා කරන ලද ඉඩම්වලින් ද බදු අය කරනු ලැබූ අතර එම බද්ද කොළවෙල් අය යනුවෙන් හැඳින්වේ. විශාල වතුවල හා ගෙවතුවල වවන ලද ගස් වැල් ආදියේ හටගන්නා ඵලවලින් කොටසක් වසරකට හෝ මාස කිහිපයකට වරක් පඬුරු වශයෙන් හෝ බදු වශයෙන් රජ මාළිගයට ගෙවීමට ජනතාවට සිදු විය (රණවැල්ල, 2003 : 245). පස්වන කාශ්‍යප රජුගේ පඬුවස්නුවර ටැම් ලිපියේ "ගැමින් පිටත ගස් ඔත දස වැකින් පතක් ගන්නා ඉම" යනුවෙන් ගසක ගෙඩි දහසකින් එකක් රජයට ගෙවිය යුතු බව දැක්වේ (Ranawella, 2001: 354). එකොළොස්වන හා දොළොස්වන සියවස්වල ධාන්‍ය බද්දෙන් කොටසක් ධාන්‍යවලින් ගෙවා අනෙක් කොටස මුදලින් ගෙවන ලද බවට තොරතුරු හමුවේ. රජු විසින් රුහුණේ වැසියන්ගෙන් උත්තේ අමුණකට අය එකමුණු තුන්පැළක් හා මඩරන් සකක් හා මැන්දේ අමුණකට එකමුණු දෙපැළක් හා මඩරන් සතර අක හා පැස්සේ අමුණකට අය එකමුණු පැළ හා මඩරන් තුනක බැගින් අය ගන්නා නියායෙන් ව්‍යවස්ථා කොට වදාරණ ලද බව ඔහුගේ වාඳුරුප්ප පුවරු ලිපියේ සඳහන් වේ (Ranawella, 2001: 354).

16වන සියවසේ මුල් කාලයේ රචිත කැලණි සන්නසේ පොල් ගස් දහයකට පනම බැගින් පඬුරු ගෙවිය යුතු බව ද, කුඹුරු අමුණකට දෙපැළක් බැගින් ගෙවිය යුතු බව ද දක්වා ඇත (කොඩ්රින්ටන්, 1980: 55). මහනුවර රාජධානි සමය වන විට ද රජයේ ප්‍රධාන ආදායම් මාර්ගයක් වූයේ ඉඩම් වගාවෙන් ලබා ගත් ආදායම යි. අස්වැන්න භුක්ති විඳින අධිපතියා තම ඉඩමෙන් මහ අරමුදලට ලැබිය යුතු ආදායම භාර දිය යුතු වූ බව ජෝන් ඩොයිලි ද සඳහන් කර ඇත (සෝමරත්න, 2005: 191). එමෙන් ම ඩොයිලි සඳහන් කරන අන්දමට කද රාජකාරිය යනුවෙන් දක්වා ඇත්තේ ද මෙවැනි බදු වර්ගයකි. මෙහි දී රට වැසියන් විසින් සෘජුව ම රාජ්‍ය භාණ්ඩාගාරයට මෙම බද්ද ගෙවිය යුතු වූ අතර ඉන් කොටසක් මුදලින් ද, කොටසක් සහල්වලින් ද, අනෙක් කොටස භවභෝගවලින් ද ගෙවිය යුතු විය (සෝමරත්න, 2005: 42). දේශීය රාජධානි සමයේ රාජ්‍ය භාණ්ඩාගාරයේ ප්‍රධාන ආදායම් මාර්ගය ඉඩම්වලින් ලත් බදු ආදායම වූ බව මේ අනුව පැහැදිලි වේ.

අනුරාධපුර රාජධානි අවධියේ සිට ම රජයේ ප්‍රධාන ආදායම් මාර්ගය වූයේ ඉඩම්වලින් ලත් බදු ආදායම යි. එබැවින් එම රාජ්‍ය ආදායම ලබා ගැනීම හා ඒවා ක්‍රමානුකූලව පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් විධිමත් වැඩ පිළිවෙළක් සකස් කිරීමට මෙරට පාලකයෝ කටයුතු කළහ. රාජ්‍ය ආදායම එක්රැස් කර තැබූ ස්ථානය රාජ්‍ය භාණ්ඩාගාරය නම් විය. මෙම භාණ්ඩාගාරය භාරව ප්‍රධාන නිලධාරියෙකු සිටි අතර එම පුද්ගලයා භාණ්ඩාගාරික නම් විය. සෙල්ලිපිවල මොහු හැඳින්වීමට බඩගරික, බඩකරික, බඩකරිය වැනි වචන භාවිත කොට ඇත (රණවැල්ල, 2003: 237).

සිතුල්පව්වේ පිහිටුවා ඇති ක්‍රි. පූ. දෙවන සියවසට පමණ අයත් ලෙන් ලිපියක පරුමක සුමණ නම් භාණ්ඩාගාරිකයෙකු (බඩකරික පරුමක සුමන) පිළිබඳ ව සඳහන් වේ (රණවැල්ල, 2003: 237). වසභ රජුගේ පෙරිමියන්කුලම පර්වත ලිපියෙහි රාජ්‍ය දේපළ කළමනාකරු බඩකරිය යනුවෙන් හඳුන්වා ඇත (Wickramasing, 1912: 73). එකොළොස්වන හා දොළොස්වන සියවස්වල භාණ්ඩාගාරික තනතුර දැරූ නිලධාරීන් හඳුන්වා ඇත්තේ භණ්ඩාගාරාධිකාරි හෙවත් භණ්ඩාරපොතුන් (භණ්ඩාරපොත්ථකීන්) යනුවෙනි (ශ්‍රී සුමංගල සහ ද සිල්වා, 1912: 69 පරි, 27 ගාථාව). භාණ්ඩාගාරිකගේ සහාය සඳහා ගණක නම් නිලධාරියෙකු සිටි බවට තොරතුරු ලැබේ. පරාක්‍රමබාහු රජු දක්ෂිණ දේශය පාලනය කළ සමයේ ඔහු තම රාජ්‍යය කොටස් දෙකකට බෙදා ගණකාමාත්‍යවරුන් දෙදෙනෙකු පත් කළ බව මහාවංසයේ සඳහන් වේ (ශ්‍රී සුමංගල සහ ද සිල්වා, 1912: 69 පරි. 27 ගාථාව).

වඩා විධිමත් ලෙස ආදායම් බදු ලබා ගැනීමේ ක්‍රම වේදයක් පැවතියේ මහනුවර රාජ්‍ය සමයේ ය. මේ සඳහා ලේකම්මිටිවල එන වාර්තා උපයෝගී කරගන්නා ලදී. මෙකල අයබදු එකතු කිරීමේ පහසුව සඳහා රාජ්‍ය පාලකයෙකු බලයට පත් වූ මුල් අවුරුද්දේ ම මුල්වර ලිවීම සිදු කෙරේ. අයබදු එකතු කිරීමේ පහසුව සඳහා වපසරිය අනුව කුඹුරු ප්‍රමාණය ලියා වාර්තාකර තබා ගැනීම මුල්වර ලිවීම යන්නෙන් අදහස් කෙරේ (අභයවර්ධන, 1978: 248). රජු විසින් පත් කරන ලද ආදායම් පාලක නිලධාරිහු රටේ සියලු ඉඩම් පරීක්ෂා කර අස්වැද්දූ ඉඩම්, පුරන්ව ගිය කුඹුරු, මැරීගිය ගහකොළ ආදී වශයෙන් අදායම් ලැබෙන සහ නොලැබෙන තැන් ඒ ආකාරයෙන් ම සටහන් කර ගත්හ. ඉන් පසුව එම ඉඩම්වලින් අයවිය යුතු අයබදු ප්‍රමාණය තීරණය කෙරිණ (අභයවර්ධන, 2009: 248). මහනුවර යුගයේ දී රටේ වී වගා කළ මුළු භූමි ප්‍රමාණය කත්වලට බෙදා ඇත. එසේ කරනු ලැබුවේ කත් රාජකාරිය නියම කිරීම පහසු වනු පිණිස ය. ඉඩමේ වපසරිය හා සශ්‍රීකත්වය අනුව රාජ්‍ය භාණ්ඩාගාරයට කත් වශයෙන් දිය යුතු බදු ප්‍රමාණය එහි සඳහන් වේ. රජයේ නිත්‍ය සේවාවල නිරත නොවන පුද්ගලයන් කත්හාල් රාජකාරියට යටත් විය කත්හාල් රාජකාරිය රජයේ ප්‍රධාන ආදායම් මාර්ගයක් විය (අභයවර්ධන, 1978: 71).

### 5.4 රටවැසියන් අතර ඉඩම් බෙදා දීම

දේශීය ඉඩම් භුක්ති ක්‍රමය යටතේ රජතුමා විසින් ඉටු කළ තවත් වැදගත් කාර්යභාරයක් වූයේ රජයට අයත් ඉඩම් විවිධ ආකාරයට රටවැසියන් අතර බෙදා දීම යි. ඒ අනුව සෑම පුද්ගලයකුට ම ඉඩම් හිමි වීමේ කිසියම් නීත්‍යානුකූලභාවයක් දක්නට ලැබිණි. එමෙන් ම පුද්ගලයන්ට ඉඩම් ලබා දීමේ දී අනුගමනය කළ ක්‍රමවේදය සෑම අවස්ථාවකදී ම එක සමාන නො විණි. විවිධ අවස්ථාවල විවිධ පුද්ගලයන් විසින් රජයට කරන ලද සේවාවන් පදනම් කර ගෙන ඔවුන්ට භුක්ති විඳීම සඳහා රජය සතු ඉඩම් ලබා දී ඇත.

මෙරට පාලකයෝ බොහෝ අවස්ථාවල දී විහාර දේවාල නඩත්තුව සඳහා ඉඩම් පූජා කළ අතර ඇතැම් පාලකයෝ තමන්ගේ ගෞරවය භික්ෂූන් වහන්සේලාට ප්‍රකාශ කිරීම සඳහා නොයෙක් අන්දමේ පරිත්‍යාග කළහ. එමෙන් ම තවත් අවස්ථාවල දී පරලොව පින් තකා භික්ෂූන් වහන්සේලාට දානමාන පින්කම් කිරීමට අමතරව නොයෙක් ආකාරයෙන් නිශ්චල දේපළ පරිත්‍යාග කරන ලදී. මෙබඳු පරිත්‍යාග අතර ඉඩම් පරිත්‍යාගවලට මූලික ස්ථානයක් හිමි විය (විජේතුංග, 2007: 25-27). ගම්වර දසදහසක්, බොහෝ ගම්වරයන්, දහසක් ගම්වර ආදී වශයෙන් ගම්වර විශාල ප්‍රමාණයක් පිළිබඳ තොරතුරු ශ්‍රී ලාංකේය ඉතිහාසයෙන් හෙළි කර ගත හැකි ය. මෙසේ විහාර දේවාල උදෙසා පූජා කරන ලද ඉඩම් විහාර දේවාලගම් ලෙස හැඳින්වී ය. විහාරගම් බෞද්ධ සිද්ධස්ථානවලට අයිති වූ අතර දේවාලගම් විවිධ දෙවියන් උදෙසා දේවාලවලට පූජා කරන ලදී. ක්‍රි. පූ. යුගවල සිට ම ශ්‍රී ලංකාවේ පාලකයන් විහාර දේවාලවලට ඉඩකඩම් පූජා කළ බවට තොරතුරු සෙල්ලිපිවල මෙන් ම වංසකතාවල ද සඳහන් වේ. මෙම ඉඩම් රාජකාරිවලින් ද, බදු ගෙවීමෙන් ද නිදහස් කර තිබිණි. එහෙයින් විහාර දේවාලවලට ඉඩම් පූජා කිරීම නිසා ඇතිවන පාඩුව අව ම කර ගැනීම සඳහා පුද්ගලික ඉඩම් පූජා කිරීමේ දී රජුගෙන් ඒ සඳහා අවසර ලබා ගත යුතු විය (වනසිංහ, 2008: 95-96). ඩේවි උපුටා දක්වමින් වනසිංහ පෙන්වා දෙන්නේ මෙබඳු ඉඩමක් පරිත්‍යාග කිරීම සඳහා රජුගේ අවසරය ලබා ගැනීමට පෙත්සමක් ඉදිරිපත් කළ යුතු බවය. "මගේ යහපත තකා මෙය විහාරයකට පරිත්‍යාග කිරීමට කැමැත්තෙමි. දේවයන් වහන්ස ඔබේ යහපතට ද එය හේතු වන නිසා ඒ සඳහා අවසර දෙන සේක්වා" යනුවෙන් එහි දැක්වේ (වනසිංහ, 2008: 95-96). මෙබඳු අවස්ථාවක රජුගේ අවසරය එම පුද්ගලයාට ලබා ගත හැකි විය. ශ්‍රී ලංකාවේ බුදුසසුන ව්‍යාප්ත වූ මුල් කාලයේ භික්ෂූන් වහන්සේලාට ලෙන් පූජා කිරීමේ දී අගත අනගත චතුදිස සගස දිනෙ යනුවෙන් සමස්ත සංඝයා වෙනුවෙන් ම ලෙන් පූජා කෙරිණි. එහෙත් පසුව මෙම තත්ත්වය වෙනස් වී ඒවා එක් එක් විහාරස්ථාන හෝ නිකායන්ට අත්පත් වීම දක්නට ලැබිණි. මෙම විහාරස්ථාන සතු ඉඩම් සඳහා යම් මුදලක් ගෙවා එම භූමියෙහි වෙහෙර විහාර කරවීමට කටයුතු කළ දායකයන් පිළිබඳව ද තොරතුරු හෙළි වේ. ගජබා රජුගේ මව භික්ෂූන් වහන්සේලා උදෙසා කරවූ රාජමාතු විහාරයේ භූමිය ලබා ගැනීම සඳහා මහා විහාරයට ලක්ෂයක් ගෙවූ බව මහාවංසයේ සඳහන් වේ (ශ්‍රී සුමංගල සහ ද සිල්වා, 1912: 35 පරි). නවවන සියවසට අයත් අභයගිරි සංස්කෘත ලිපියේ සඳහන් ආකාරයට අම්බිල ග්‍රාම, හුනාල, ලහසිකා උලවන්නාරි, බන්ටී ග්‍රාම, කීරා, පල්ලාය, සුනග්‍රාම ආදිය අභයගිරි නිකායට අයත් විහාරවලට හිමි ඉඩම් බව පැහැදිලි වේ. එමෙන් ම භික්ෂූන් වහන්සේලාට පුද්ගලිකව හිමි වූ ඉඩම් පැවති බවට ද තොරතුරු අනාවරණය වේ. වළගම්බා රජු තිස්ස තෙරුන්ට අභයගිරි විහාරය පූජා කොට ඇත (ශ්‍රී සුමංගල සහ ද සිල්වා, 1912: 33 පරි).

දේශීය පාලන ක්‍රමය යටතේ විවිධ තරාතිරමේ පුද්ගලයන් රාජ්‍ය සේවය වෙනුවෙන් ඉඩම් ප්‍රදාන ලබා ඇත. රජුගේ අමාත්‍ය මණ්ඩලයේ සේවය කළ නිලධාරින්ගේ සිට වෛද්‍යවරයා හා විවිධ විෂය භාර අධ්‍යක්ෂ වරු දක්වා පිරිස් තම සේවා සඳහා ඉඩම් ප්‍රදාන ලැබුවෝ වෙති (රණවැල්ල, 2003: 241, 242). ඊට අමතරව රාජ්‍ය සේවයේ නිරත වූ පහළ ශ්‍රේණියේ නිලධාරින් වශයෙන් කටයුතු කළ විවිධ බදු එකතු කරන්නන්, භාණ්ඩාගාර නිලධාරින්, ආරක්ෂක නිලධාරින්, රේගු බදු අය කරන්නන්, උයන්පල්ලන්, වේත්‍රධාරින්, කුඹුරු ඉඩම් පිළිබඳ විධායක නිලධාරින්, කුඹුරු ඉඩම් පරික්ෂකවරුන්, සේවා අධිකාරිවරුන්, වෙල්විදානේවරුන් ආදී රජයට විවිධ සේවා සැපයුවෝ ඔවුන්ගේ වැටුප් වශයෙන් ඉඩම් ප්‍රදාන ලැබූවෝ වෙති (රණවැල්ල, 2003: 241, 242). මෙම නිලධාරින්ගේ ජීවනෝපාය සඳහා ලබා දුන් ඉඩම්, ඒවායෙන් රජයට අයවන බදු ආදායම් සමගින් ම පවරා දීම සිදු විණ.

භෝගගාම, බත්තගාම (බත් ගම) නැතහොත් දිවෙල් ගම වශයෙන් මෙම ගම්බිම් හඳුන්වා ඇත (රණවැල්ල, 2003: 241, 242). දුටුගැමුණු රජු විසින් තම යුධ හමුදාවේ සේවය කළ නන්දිමිත්‍ර හා ඵුස්සදේව යන දෙදෙනාට මෙවැනි කෙත් වතු දිවෙල් වශයෙන් ප්‍රදානය කරන ලදි (සරණතිස්ස, 1939 : 185-206). මහාවංසයේ සඳහන් වන ආකාරයට රුහුණේ පළමුවන වික්‍රමබාහු (ක්‍රි. ව. 1029-1040) රජු ඔහුගේ බුද්ධ නැමති අමාත්‍යවරයකුට ප්‍රවේණි ගමක් පවරා දී ඇත (ශ්‍රී සුමංගල සහ ද සිල්වා, 1912: 54 පරි, 80). යම්කිසි රාජකාරියක් පදනම් කර ගෙන සේවා සැපයීම වෙනුවෙන් ප්‍රදානය කරනු ලැබූ ඉඩම් එම රාජකාරිය අවසන් වූ විට නැවත රජය සතු විය. ඊට අමතරව යම් යම් පුද්ගලයන්ගේ සුවිශේෂ දක්ෂතා පදනම් කර ගෙන ද ඉඩම් ප්‍රදානයන් සිදු කර ඇති බවට සාධක හමුවේ. මෙරට අවසන් ස්වාධීන රාජ්‍යය වූ උඩරට රාජ්‍යයේ පැවති ඉඩම් භුක්ති ක්‍රම සම්බන්ධයෙන් අදහස් දැක්වීමේ දී විවිධ සේවාවන් පදනම් කර ගෙන රජු ඉඩම් ලබා දුන් බව ජෝන් ඩොයිලි සඳහන් කොට ඇත (සෝමරත්න, 2005: 58). ඔහු සඳහන් කරන අන්දමට රජුගේ පෞද්ගලික සේවාවන් කළ අයට පවා වැටුප් වශයෙන් ඉඩම් ලබා දී ඇති අතර ඔවුහු සිය ජීවිකාව සලසා ගැනීම සඳහා ඒවා වගා කළහ (සෝමරත්න, 2005: 58-60).

ඉඩම් ප්‍රදානය සිදු වූයේ කිසියම් ගෞරව පූර්ව තත්ත්වයක් පදනම් කර ගෙන නම් එබඳු ඉඩම් ඔවුන්ට පාරම්පරිකව භුක්ති විඳීමේ අයිතිය තිබිණි. රජය වෙනුවෙන් සිදු කරන ලද යම් යම් සේවා පදනම් කර ගෙන ඉඩම් ප්‍රදානය කිරීම ද දේශීය රාජධානි සමයේ සිදු වූවකි. පළමුවන පරාක්‍රමබාහු රජුගේ යුද හමුදාවේ සේවය කළ කිත්ති නම් සේනාපතියා බුරුමය ආක්‍රමණය කර පැමිණීම නිමිත්තෙන් පරාක්‍රමබාහු රජතුමා ඔහුට ඉඩම් පරිත්‍යාග කළේ ය. මෙබඳු පරිත්‍යාග වශයෙන් ලබා දුන් ඉඩම් ගම්වර නැතිනම් පමුණු ඉඩම් යනුවෙන් හඳුන්වා ඇත. සහස්සමල්ල (ක්‍රි. ව. 1200- 1202) රජු සිංහාසනාරූඪ කරවූ ආබෝනා සෙනෙවියාට රජු විසින් ගම්වරයක් පූජා කරනු ලැබූ බව සඳහන් වේ (විජේතුංග, 2007: 50-60 ). පළමුවන විජයබාහු (ක්‍රි. ව. 1055-1119) රජු, පළමුවන පරාක්‍රමබාහු (ක්‍රි. ව. 1153-1186) රජු හා දෙවන පරාක්‍රමබාහු (ක්‍රි. ව. 1236-1270) රජු මෙන් ම බොහෝ පාලකයෝ මේ අන්දමින් දක්ෂතා දැක්වූවන්ට ගම්වර පූජා කළහ (විජේතුංග, 2007: 50-60). දෙවන රාජසිංහ (ක්‍රි. ව. 1635-1687) රජුට සුදු ඇතෙකු පරිත්‍යාග කළ මඩුවන්වෙල රටේරාල මෙබඳු ගම්වරයකින් පිදුම් ලැබූවෙකි (ඥාණවිමල, 2001: 289).

ශ්‍රී ලංකාවේ ඉඩම් භුක්තිය හා ඉඩම් ප්‍රතිපත්තිය දෙස විමර්ශනාත්මකව බලන විට මෙරට ජනතාව විවිධ ආකාරයෙන් ඉඩම් භුක්ති විඳි බව පැහැදිලි වේ. මෙසේ ඉඩම්වල අයිතිය හිමි වූ ආකාරය අනුව ශ්‍රී ලංකාවේ එබඳු ඉඩම් වර්ග කිහිපයක් හඳුනාගත හැකි ය. දේශීය පාලන ක්‍රමය තුළ ජනතාව භුක්ති විඳි ඉඩම් අතරින් එක් ඉඩම් වර්ගයක් ලෙස ගබඩාගම් හඳුන්වා දිය හැකි ය. ගබඩාගම් යන්නෙන් රජුගේ ඉඩම් යන්න අදහස් කෙරේ. රාජ්‍ය භාණ්ඩාගාරයට සම්බන්ධ කර තිබූ මෙම ඉඩම් මුත්තෙට්ටු ඉඩම් ලෙස ද හැඳින්විණි. මුත්තෙට්ටු ඉඩමක් යනු රජු වෙනුවෙන් හෝ වෙනත් අයිතිකාරයකු වෙනුවෙන් හෝ තාවකාලික වශයෙන් එම ඉඩම ලබා සිටි පුද්ගලයා වෙනුවෙන් හෝ වගා කරනු ලැබූ ඉඩමය (Codrinton, 1938: 23). මුත්තෙට්ටු ඉඩම් රාජ්‍ය භාණ්ඩාගාරයේ ප්‍රයෝජනය සඳහා එහි වැසියන් විසින් වගා කරනු ලබන බව ජෝන් ඩොයිලි සඳහන් කර ඇත (සෝමරත්න, 2005 : 191). රජු සතු ඉඩම් රජයේ ආදායමක් වශයෙන් වගා කරන ලද බව මෙයින් පැහැදිලි වේ. නින්ද මුත්තෙට්ටුව හා අඳ මුත්තේට්ටුව වශයෙන් මුත්තෙට්ටු ඉඩම් වර්ග දෙකක් පිළිබඳ ව සඳහන් වේ. නිලකාරයන් විසින් අයිතිකාරයා වෙනුවෙන් හෝ ඉඩම් ප්‍රදානය ලත් තැනැත්තා වෙනුවෙන් හෝ ප්‍රධානියා වෙනුවෙන් හෝ සම්පූර්ණයෙන් ම

නොමිලයේ වගා කළ යුතු ඉඩම් නින්ද මුත්තෙට්ටු ඉඩම් වශයෙන් හැඳින්වී ය. අඳ මුත්තේට්ටුව යනු වගා කරන ලද භෝගයෙන් දෙකෙන් පංගුවක් අයිතිකරුට ලබා දීමේ කොන්දේසිය මත ලබා දෙන ඉඩම් ය (Codrinton, 1938: 23). ඩොයිලි සඳහන් කරන අන්දමට අඳ මුත්තෙට්ටු ඉඩම් වගා කිරීමට කිසිවකු බැඳී නැත (සෝමරත්න, 2005: 191). විදාන මුත්තෙට්ටු ඉඩම් යනුවෙන් තවත් ඉඩම් වර්ගයක් දේශිය ඉඩම් භුක්ති ක්‍රමය තුළ දක්නට ලැබුණු අතර මෙම ඉඩම විදානේවරයෙකු තම ස්වාමියා වෙනුවෙන් කරනු ලබන සේවයට ස්වාමියාගේ ඉඩමෙන් අත්පත් කර ගෙන සිටින ඉඩම් කොටසකි (කොඩ්රින්ටන්, 1980: 35). දේශීය ඉඩම් වර්ග කිරීම තුළ බිසෝගම් යනුවෙන් තවත් ඉඩම් වර්ගයක් පැවති අතර එම ඉඩම් රජ වාසල බිසවට අයත් ඉඩම් වශයෙන් හඳුනාගෙන ඇත (අභයවර්ධන, 1978: 235).

ශ්‍රී ලංකාවේ පැවති ඉඩම් භුක්ති ක්‍රමය තුළ දීර්ඝ කාලයක් යම් පුද්ගලයෙක් එක ම ඉඩමක් භුක්ති වින්දේ නම් එම ඉඩම ඔහුට අයිති විය හැකි ය. දේශීය ඉඩම් ප්‍රතිපත්තිය තුළ මෙබඳු ඉඩම් අයිතියක් හිමි වූයේ එම පුද්ගලයා කරන ලද සේවාව පදනම් කර ගනිමිනි. ඉඩකඩම් අරබයා කිසිවෙකු ලද නීත්‍යානුකූල අයිතිය ඔහුට හිමි වූ උසස් ම දේපළ ලෙස සලකනු ලැබී ය. බොහෝ අවස්ථාවල දී මෙම අයිතිය රාජකාරිය හා බැඳී පැවතිණ. රාජකාරිය පරම්පරාවෙන් පරම්පරාවට හිමි වන විට එම රාජකාරිය මත හිමි වූ ඉඩම ද එම පරම්පරාවට ම හිමි විය. යම් කිසි අවස්ථාවක මෙම රාජකාරිය පැහැර හැරියේ හෝ ඔවුන්ගෙන් බැහැර වූයේ නම් ප්‍රවේණි අයිතියක් වුව ද එම ඉඩම ඔහුට අහිමි වී යාමට ඉඩ තිබිණ. සම්ප්‍රදායික ඉඩම් භුක්ති ක්‍රමය තුළ ඉඩම් අහිමි වීමේ සුවිශේෂ ලක්ෂණයක් ලෙස මෙය හැඳින්විය හැකි ය. ඉඩමේ අවසාන අයිතිය රජය සතු වූ බව මෙමගින් ද පැහැදිලි වේ.

රජුට අයත්ව තිබූ ගබඩාගමක් යම්කිසි පුද්ගලයකුගේ නිලයට අතිරේක ආදායමක් ලෙස තෑගි වශයෙන් පවරා දුන් අවස්ථා ද දැකිය හැකි ය. මෙසේ පවරා දුන් ගබඩාගම් නින්දගම් ලෙස හැඳින්වී ය. මේ අන්දමින් යම් දීමනාවක් ස්ථිරවම යම් පුද්ගලයකුට පවරා දුන්නේ නම් එබඳු ඉඩමක් ප්‍රවේණි නින්දගමක් ලෙස හඳුන්වා ඇත. ප්‍රවේණි ඉඩම් ඒ ඒ පුද්ගලයාට හිමි වූ ආකාරය අනුව වර්ග කීපයකි. අඳ ප්‍රවේණි ඉඩම් යන්න ඉන් එක් වර්ගයක් වූ අතර මෙම ක්‍රමයේ දී මුලින් රජය සතුව තිබී අනවසරයෙන් හෙළි පෙහෙළි කොට වගා කරන ලදුව එම බිමෙන් අඩක් ගොවියාට අයිති විය.  මෙම ඉඩම විකිණීමට හෝ උකස් කිරීමට ඔහුට හැකියාව තිබුණි (කොඩ්රින්ටන්, 1980: 35).

අස්වනු පරවෙණි යනුවෙන් තවත් ඉඩම් වර්ගයක් තිබූ අතර ඉන් අදහස් වූයේ පරවෙණි ඉඩමක් අයිතිව සිටින්නෙකු විසින් අයුතු ලෙස ඇඳා ගන්නා ලද ඉඩම් වේ. මීට අමතරව රජයට ඔතු බදු ගෙවීම තුළින් උරුම වූ ඔතු පරවෙණි වශයෙන් හඳුන්වන ඉඩම් වර්ගයක් පිළිබඳව තොරතුරු ලේකම්මිටිවල සඳහන් වේ. මෙබඳු ඉඩම් රාජ සන්තක කළ නොහැකි ය. පරපුරෙන් පරපුරට උරුම වන පරිද්දෙන් රජු විසින් දෙන ලද ඉඩම් පරවෙණි නම් වූ බව ඉහත සඳහන් තොරතුරුවලින් පැහැදිලි වේ. යම්කිසි සේවාවක්, වරප්‍රසාදයක් පමණක් නොව ඇතැම් අවස්ථාවල දී රජුට යම්කිසි ගෙවීමක් කොට ප්‍රවේණි ඉඩම් ලබා ගත් බවට සාධක තිබේ. "පෙර රජුන්ට බෙලි ඵලයක් පුරා වස්තු දී ප්‍රවේණි සැලැස්මට එක්තරා කෙළෙඹි පුත්‍රයෙක් බිම් ගත් හෙයින් ද" යනුවෙන් ශ්‍රී ලංකාද්වීපයේ කඩයිම් පොතේ සඳහන් වීමෙන් ඒ බව පැහැදිලි වේ (අභයවර්ධන, 1978: 161). මෙසේ මිල දී ගත් ඉඩම් එම පරපුර විසින් ප්‍රවේණි ලෙස භුක්ති විඳින ලිදි.

## 6. සමාලෝචනය

දේශීය රාජාණ්ඩු ක්‍රමය තුළ පාලකයා සතුව පැවති බලතල අසීමිත විය. මෙම අසීමිත බලතල රටේ ඕනෑම ක්ෂේත්‍රයක් කෙරෙහි බල පැවැත්වීමේ හැකියාව ඔහුට තිබිණි. මේ අනුව ඉඩම් භුක්ති ක්‍රමය සම්බන්ධයෙන් ද රජු සතු වූ අසීමිත බලතල නිසා ඉඩම් රාජසන්තක කිරීමේ හැකියාව ඔහු සතු විය. 'අස්වාමික ඉඩම් රාජ සන්තක ය' යන සම්මතය අතීතයේ සිට පැවත ආවකි. මෙම අදහස පදනම් කර ගෙන ඇතැම් අවස්ථාවල පාලකයෝ තම විරුද්ධවාදීන්ගේ ඉඩම් රාජ සන්තක කර ගැනීමට කටයුතු කළහ. මහා විහාරය පාළුවට ගිය අවස්ථාවේ එම ඉඩම රාජ සන්තක කර ගැනීම මීට නිදසුනක් ලෙස පෙන්වා දිය හැකි ය. කලාතුරකින් සිදු වූ මෙවැනි සිදුවීමක් හැර විහාරස්ථාන සතු ඉඩකඩම් රාජ සන්තක කිරීමට රජවරු උත්සුක නො වූහ. ඇතැම් සැදැහැවත් රජවරු පාළු වූ සිද්ධස්ථාන ප්‍රතිසංස්කරණය කරවා ඒවා නැවත එම විහාරස්ථානවලට ම පූජා කළහ. දරුණු අපරාධවලට සම්බන්ධවූවන්ගේ ඉඩම් රාජ සන්තක කිරීමට රජුට බලය තිබිණි. රාජද්‍රෝහි වූවන්ගේ ඉඩම් ද රාජ සන්තක කිරීමට රජුට හැකියාව තිබිණි. ධාතුසේන රජතුමා තමන්ට එරෙහිව විදේශික ද්‍රවිඩයන්ට පක්ෂපාතී වූවන්ගේ ඉඩම් රාජසන්තක කළේ ය. නමුත් බොහෝ අවස්ථාවල දී දේශීය පාලකයන් එබඳු දැඩි ක්‍රියා මාර්ගවලට නොපෙළඹුණ බව පැහැදිලි වේ. සෑම පුද්ගලයකුට ම යැපීම් මාර්ගයක් සපයා දීම රජුගේ යුතුකමක් හා වගකීමක් ලෙස සිතීමට දේශීය පාලකයෝ පුරුදු වී සිටි බැවින් ඔවුහු මෙබඳු ක්‍රියාමාර්ගවලට නොපෙළඹුණ හ. දේශීය පාලකයා සතුව අසීමිත බලතල පැවතිය ද ඒවා ජනතා අයහපත සඳහා නොයෙදූ බව ද මෙමගින් පැහැදිලි වන කරුණකි.

දේශීය රාජධානි පැවති අවධියේ ඒ ඒ වගාවන්ට ගැළපෙන අයුරින් භූමිය යොදා ගැනීමට කටයුතු කළා පමණක් නොව ස්වාභාවික පරිසරය ආරක්ෂා වන අන්දමින් වන ගහනයන් ඉතිරිකර තැබීම ද මෙම පාලන ක්‍රමය තුළ ඉතා මැනවින් දක්නට ලැබිණි. මේ අනුව දේශිය ඉඩම් භුක්ති ක්‍රමය ඉතා නම්‍යශීලී මෙන් ම සමතුලිත තත්ත්වයකින් පවත්වා ගෙන යාමට පාලකයා කටයුතු කළ බව පැහැදිලි ය. පණ්ඩුකාභය රජු (ක්‍රි. පූ. 456-386 ) අනුරාධපුර නගර නිර්මාණයේ දී පරිසරය ආරක්ෂා වන පරිදි රක්ෂිත වනාන්තර වෙන් කළ ආකාරය නිදසුනක් ලෙස දැක්විය හැකි ය. ඉතා ක්‍රමාණුකූලව සකස් වූ ඉඩම් භුක්ති ක්‍රමයක් දේශීය රාජධානි සමයේ පැවති බව ද, එම ක්‍රමය යටතේ ස්වයංපෝෂිත ආර්ථික ක්‍රමයක් මෙරට පවත්වා ගෙන යාමට දේශීය පාලකයා සමත් වූ බව ද මේ අනුව පැහැදිලි ය.

## පරිශීලන නාමාවලිය

අභයවර්ධන, එච්. ඒ. පී. (1978). *කඩඉම්පොත් විමර්ශනය.* කොළඹ: සංස්කෘතික දෙපාර්තමේන්තුව.

කොඩ්රින්ටන්, එච්. ඩබ්. (1980). *ශ්‍රී ලංකාවේ පුරාණ ඉඩම් භුක්තිය හා* ආදායම. බත්තරමුල්ල: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

ඤාණවිමල, කිරිඇල්ලේ. (2001). *සබරගමුවේ පැරණි ලියවිලි.* නුගේගොඩ: මානව හිතවාදී ලේඛක පර්ෂදය.

ධීරානන්ද, හඟුරන්කෙත. (2004). *රාජ්‍යත්වය, රජය සහ ආගම.* වරකාපොළ: සූරිය ප්‍රකාශකයෝ.

බුද්ධදත්ත, පොල්වත්තේ සහ ධම්මකිත්ති, සිරිදේවමිත්ත (සංස්). (1959). *සීහලවත්ථුප්පකරණය.* කොළඹ: ත්‍රිපිටක මුද්‍රණාලය.

රණවැල්ල, සිරිමල්. (2003). *රෝහණ රාජ්‍යයේ ඉතිහාසය.* රුහුණ විශ්වවිද්‍යාලය.

විජේතුංග, සිරිසමන්. (2007). *ශ්‍රී ලංකාවේ ශිලාලිපි සන්නිවේදනය.* වරකාපොළ: ආරිය ප්‍රකාශකයෝ .

ශ්‍රී සුමංගල, හික්කඩුවේ සහ ද සිල්වා, දොන් අන්ද්‍රියස් බටුවන්තුඩාවේ (පරි). (1912). *මහාවංසය.* කොළඹ: ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව.

සරණතිස්ස ඒ. (සංස්). (1939). *රසවාහිනිය 2*. කොළඹ: පීතාලංකාර මුද්‍රණාලය.

සෝමරත්න, එච්. ඇම්. (පරි). (2005). *සිංහලේ ආණ්ඩුක්‍රමය පිළිබඳ ලුහුඬු සටහන්.* බොරලැස්ගමුව: විසිදුනු ප්‍රකාශකයෝ.

හෙට්ටිආරච්චි, ඇස්. බී. (2008). *ශ්‍රී ලංකාවේ සමාජ හා සංස්කෘතික ඉතිහාසය.* මහරගම: තරංජී ප්‍රින්ට්ස්.

වනසිංහ, යසපාල., (පරි.). (2008). *ඩේවි දුටු උඩරට රාජ්‍යය සහ එහි වැසියෝ.* කොළඹ: ගොඩගේ සහෝදරයෝ.

Codrinton, H.W. (1938). *Ancient Land Tenure Revenue in Ceylon*. Colombo: Government press

Paranavitane, S. (Ed.). (1943). *Epigraphia Zeylanica VoL* 1V: London.

Paranavitana, S. Godakumbura, C. E. (1963). *Epigraphia Zeylanica VoL V part* 1: Sri Lanka Department of Arcaeology.

Paranavitana, S. (1983). *Inscriptions of Ceylon Vol II part* I. Sri Lanka: Department of Archaeology.

Perera, L. S. (1959). *Proprietary and Tenurial Rights in Ancient Ceylon. Ceylon Journal of Historical and Social Studies* Vol II: Colombo.

Ranawella, Sirimal. (2001). *Inscriptions of Ceylon Vol V Part* 1, Department of Archaeology, Sri Lanka.

Wickramasinghe, Don Martino De Silva. (1912). *Epigraphia Zeylanica VoL I*, London: Oxford University.

Wickramasinghe, Don Martino De Silva. (1928). *Epigraphia Zeylanica VoL* II 1912-1927: London: Oxford University.